**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2022-12-21 |

පැමිණිලි පාර්ශවය : ඩබ්.එම්.ආර්.පී. විජේකෝන් මයා.
අංක 112, හාට්ලන්ඩ්, මිලේනියම් සිටි,
කොටුගොඩ,
ජාඇල.

වගඋත්තර පාර්ශවය : අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා රේගු දෙපාර්මේන්තුව,
අංක 40, කලින් වීදිය ,
කොළඹ 11.

<u>පැමිණිලි අංකය : **HRC/1777/17**</u>

**පෙත්සම තුළින් දක්වා ඇති කරුණු දැක්වීම :-**

ශ්‍රී ලංකා රේගුව තුළ රේගු නිලධාරීන්ට රාජකාරි කටයුතු සිදු කිරීමේදී පුද්ගලයින් අනුව වෙනස් කොට සළකමින් යම් යම් පෞද්ගලික හේතු මත ද්වේශ සහගතව කටයුතු කරන බව ද පක්ෂපාතිව කටුයුතු කිරීම ද හේතුවෙන් පැමිණිලිකරුවන් විසින් මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බව දක්වා ඇත.

මෙහිදී කරුණු දක්වමින්, මූලික විමර්ශන කටයුතු වලදී සාක්ෂි මගින් කරුණු තහවුරු කර ඇති වුදිත නිලධාරීන්ට එරෙහිව දැනහැඳුනුම්කම් මත විනය පියවර නොගැනීමට ක්‍රියා කරන බවද ගතයුතු විනය ක්‍රියාමාර්ග ගැනීමේදී තෝරාගත් පාර්ශවයන්ට වාසි සහගත පරිදි ද ද්වේශ සහගත පළිගැනීමකට ලක් වූ පුද්ගලයින්ට තවත් ආකාරයටද සැළකීමකට ලක් කරන බවද පෙන්වා දී ඇත. ඒ අනුව මූලික විමර්ශනයකින් තොරව හා සාක්ෂි ලබා ගැනීමකින් තොරව මෙන්ම පෙත්සම්කරු වරදක් කර ඇති බවට කරුණු තහවුරු කර ගැනීමකින්ද තොරව, ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට එරෙහිව සේවයේ අනිවාර්ය නිවාඩු ගන්වා ඇති බවත්, එබැවින් එය තම මූලික අයිතිවාසිකම් කඩවීමට හේතුවක් බවත් මෙම



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் — 011-2505451
ෆැක්ස් / தொலைநகல் — 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் — sechrcsl@gmail.com

පැමිණිල්ලෙන් පෙන්වා දී ඇත. රේගු දෙපාර්මේන්තුවේ සහකාර රේගු අධිකාරිවරයෙකු ලෙස කටයුතු කරන පැමිණිලිකරුගේ අනිවාර්ය නිවාඩු ගැනීමේ නියෝගය අවලංගු කර නැවත සේවයට වාර්තා කිරීමට ඉඩ ලබාගැනීම මෙම පැමිණිල්ලෙන් අපේක්ෂා කරන බවද පෙන්වා දී ඇත.

රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017.04.28 දිනැති ලිපියට අනුව, අනිවාර්ය නිවාඩු ගැන්වීම පිළිබඳව දක්වා ඇති අතර, රේගු දෙපාර්මේන්තුව තුළ දැනට ක්‍රියාත්මක වෘත්තීය සමිතියක් ලෙස ඇති ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සමිති සංගමය යන නම භාවිතා කර සිදු කළ වැරදි සම්බන්ධව තොරතුරු අනාවරණය වී තිබීම මත විනයානුකූල කටයුතු කිරීමට විමර්ශන ආරම්භ කළ බවත්, එතෙක් අනිවාර්ය නිවාඩු ගන්වා ඇති බවත් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

2017.10.31 දින රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ) විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එම වාර්තාවෙන් දක්වා ඇත්තේ, 1993.08.16 දින II වන පන්තියේ රේගු පරීක්ෂකවරයෙකු ලෙස 2015.04.10 දින සිටද II පන්තියේ සහකාර රේගු අධිකාරි තනතුරකටද පත්ව සේවය කළ බවත්, 2017.04.28 දින සිට ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLViii වැනි පරිච්ඡේදයේ 31 වන වගන්තියට අනුව අනිවාර්ය නිවාඩු ගන්වන ලද බවත්ය.

අනිවාර්ය නිවාඩු ගැන්වීමට හේතු වී ඇත්තේ, රේගු දෙපාර්මේන්තුව පිළිගත් වෘත්තිය සමිතියක් වූ ශ්‍රී ලංකා රජයේ නිදහස් වෘත්තිය සමිති සංගමයේ ලේකම් වශයෙන් කටයුතු කර තිබියදී, එම සංගමය 2017.03.02 දින සිට වෘත්තිය සමිති රෙජිස්ටාර් විසින් අවලංගු කළද, එසේ අවලංගු කළ දිනයට පසු දිනද මෙම වෘත්තිය සමිතියේ නාමය සහ ලිපි ශීර්ෂ භාවිතා කරමින් රාජ්‍ය සේවය අපකීර්තියට පත් කිරීම හා ආයතනයට හානි විය හැකි තොරතුරු අනාවරණය කිරීම වැනි හේතු හෙළිදරව් වීම මත ඉහත කී ආයතන සංග්‍රහයේ නීති ප්‍රතිපාදන වලට යටත්ව අනිවාර්ය නිවාඩු ගන්වන බවය. වෘත්තිය සමිති නියෝජිතයෙකු මෙන්ම රාජ්‍ය නිලධාරියෙකු වශයෙන්ද ආයතන සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කර බලතල ඉක්මවා කටයුතු කිරීම මත ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLViii වැනි පරිච්ඡේදයේ 13 වන වැනි වගන්තිය ප්‍රකාරව මූලික විමර්ශනයක් සිදු කිරීමට පියවර ගන්නා ලද බව ඔවුන්ගේ කරුණු දැක්වීම ලෙස දක්වා ඇත.

අදාළ කරුණු තහවුරු කිරීමට අනිවාර්ය නිවාඩු ගැන්වූ ලිපිය ද කම්කරු දෙපාර්මේන්තුවේ වෘත්තිය සමිති රෙජිස්ටාර් විසින් වෘත්තිය සමිති ලියාපදිංචිය අවලංගු කළ ලිපිය ද සහ වෘත්තිය සමිතිය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති අමතා යවන ලද දෝෂ සහගත බවට දක්වා ඇති ලිපිය ද වගඋත්තරකරුවන්ගේ ලේඛන සමඟ අමුණා ඇත.

**පරීක්ෂණයේදි අනාවරණය වී ඇති කරුණු :-**

2018.03.08 දින දෙපාර්ශවය කැඳවා කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද පරීක්ෂණයේදී පහත කරුණු අනාවරණය වී ඇත.

පෙත්සම්කරු වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ, වගඋත්තරකරුවන් සඳහන් කර ඇති කරුණු අනුව ශ්‍රී ලංකා නිදහස් රජයේ වෘත්තීය සංගමය සමිතියක් ලෙස 2010.03.17 දින සිට ක්‍රියාත්මක වන බවද 2017.03.02 දින සිට වෘත්තිය සමිති රෙජිස්ටාර් විසින් වෘත්තිය සමිතියේ වලංගුභාවය අවලංගු කළ බවට දක්වා තිබිම මත මෙම ගැටළු සහගත තත්ත්වය ඇති වී තිබෙන බවයි. ඒ අනුව පැන නැගුණු කරුණු මත පෙත්සම්කරු අනිවාර්ය නිවාඩු යවා තිබුණද වෘත්තිය සමිතියේ ලියාපදිංචිය නැවත වලංගු කර ලියාපදිංචි කර තිබු වෘත්තිය සමිතියේ බලාත්මකභාවය වෘත්තිය සමිති රෙජිස්ටාර් විසින් නැවත පිළිගෙන වලංගු කර ඇති බවද දක්වා ඇත. තවද අනිවාර්ය නිවාඩු ගැන්වීමක් කළ නොහැකි අතර, වැඩ තහනම් කිරීමක් සිදු කළහැකි වුවද වගඋත්තරකරුවන් කටයුතු කර ඇති ආකාරය ආයතන සංග්‍රහයට පටහැනි බව දක්වා ඇත.

වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, මූලික විමර්ශනයක් සිදු කර අවසන් නියෝගය සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ 2018.01.17 දින වාර්තා ලබාදී ඇති බවය.

පෙත්සම්කරු පරීක්ෂණ අවස්ථාව අවසන් වන විට සේවයේ පිහිටුවා ඇති අතර, වෘත්තිය සමිති ආඥා පනතට හා ඊට යටත්ව නිකුත් කළ කම්කරු දෙපාර්මේන්තුවේ චක්‍රලේඛීය ප්‍රතිපාදන අනුව වෘත්තිය සමිති ක්‍රියාකාරිකයෙකු හෝ නායකයෙකුට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීමට පෙර අදාළ සේවකයාට අයත් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් විමසා බලා පියවර ගැනීමට කටයුතු කළ යුතු නොවේද යන්න වගඋත්තර පාර්ශවය වෙතින් කරුණු විමසා ඇතත්, ඒ පිළිබඳ පැහැදිලි කරුණු දැක්වීමක් වගඋත්තරකරුවන් විසින් සිදු කර නොමැත. එමෙන්ම පරීක්ෂණ අවස්ථාවේදී පෙනී යන්නේ වෘත්තිය සමිතියේ ලියාපදිංචිය අවලංගු කළද නැවත වෘත්තිය සමිති රෙජිස්ටාර් විසින් එය බලාත්මක කර ඇත්තේ, ආරම්භ දිනයක් පිළිබඳ කරුණු දක්වා නොව 2010 වසරේ ලියාපදිංචි කළ වෘත්තිය සමිතියේ ලියාපදිංචිය තවදුරටත් අඛණ්ඩ පවතින බවට සහතිකයක් ලබාදෙමින් බව ද ඊට අදාළ ලේඛන පරීක්ෂාවේදී පෙනී යයි.

පෙත්සම්කරු වැඩිදුරටත් කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, වෘත්තිය සමිතියක ලේකම්වරයෙකු විසින් ගන්නා ලද වෘත්තිය සමිති ක්‍රියාමාර්ග පිළිබඳව ඇති චෝදනාවක් හෝ ඊට එරෙහිව ක්‍රියා කළ යුතු වුවද ලේකම්වරයා ලෙස සිටි පෙත්සම්කාර තමාගේ තනතුරු නාමය වන සහකාර රේගු අධිකාරි නමින් තීරණ ගෙන ඊට එරෙහිව කටයුතු කළ නොහැකි බවයි.

2018.06.12 දිනැති පරීක්ෂණයේදී, පෙත්සම්කරුට අදාළ ගැටළුවේදී අනිවාර්ය නිවාඩු යැවීම ආයතන සංග්‍රහය ප්‍රකාරව නීත්‍යානුකූල වේද? යන්න විමසීමේදී පෙත්සම්කරු අනිවාර්ය නිවාඩු යැවීම ආයතනය විසින් ගන්නා ලද තීරණයක් වන බවට දක්වා ඇත.

එසේම වෘත්තීය සමිති පිළිබඳ ආඥා පනතට අනුව වෘත්තීය සමිති ක්‍රියාකරුවෙකු වන එකී සමිතියේ ලේකම්ට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර අදාළ අමාත්‍යාංශයේ ලේකම් වෙතින් විමසා තිබේද? යන කාරණය සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් ලබාදිය නොහැකි බව නිරික්ෂණය වේ.

තවද වෘත්තීය සමිති ලේකම් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගයක් සමබන්ධව ඊට එරෙහිව පියවර ගැනීමට හැකියාව තිබියදී එකී වෘත්තීය සමිතියේ ලේකම් තනතුරු නාමය වන සහකාර රේගු අධිකාරි යන තනතුරු නාමයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත හැකිද? යන කාරණය සම්බන්ධයෙන්ද වගඋත්තරකරුවන් පැහැදිලි පිළිතුරක් ලබා දී නොමැති බව නිරික්ෂණය වේ.

**නිරික්ෂණ :-**

පෙත්සම්කරු විසින් සහ වඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති සමස්ත කරුණු සළකා බැලීමේදී පහත සඳහන් නිරික්ෂණ සහ නිගමන ඉදිරිපත් කළ හැක.

පෙත්සම්කරු රේගු දෙපාර්තමේන්තුවේ සහකාර රේගු අධිකාරිවරයෙකු වන අතර, ඔහු දෙපාර්තමේන්තුවේ පිළිගත් “ශ්‍රී ලංකා නිදහස් රජයේ වෘත්තිය සමිති සංගමය” නම් වෘත්තිය සමිතියේ ලේකම්වරයා වේ. අදාළ වෘත්තිය සමිතිය ලියාපදිංචිය ආරම්භ කර ඇත්තේ, 2010 වසරේදී වන අතර, ලියාපදිංචිය අවලංගු කිරීමට හේතුවක් වී ඇත්තේ, 2017.03.02 දින කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තිය සමිති රෙජිස්ටාර් විසින් කරන ලද දැන්වීමක් බවද නිරික්ෂණය වේ. එම දැන්වීමේ සඳහන්ව ඇත්තේ, “වෘත්තිය ආඥා පනතේ 50(1) වැනි වගන්තියත් ඒ අනුව පනවා ඇති 18 වැනි රෙගුලාසියත් අනුව 2016 මාතුර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂ වල වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ බැවින් මෙම සමිතියේ ලියාපදිංචිය 2016.01.20 දින අවලංගු කිරීමට අදහස් කර ඇති බවත්, එසේ ලියාපදිංචිය අවලංගු නොකළයුතු බවට හේතු තිබේ නම් වෘත්තිය සමිති ආඥා පනතේ 15(2) වැනි වගන්තිය යටතේ සමිතියේ ලේකම්ට 2015.11.17 වැනි දින දැනුම් දෙන ලෙසත්ය.” නමුත් ඒ අනුව කටයුතු නොකළ බැවින් එම ලියාපදිංචිය අවලංගු කිරීම වෘත්තිය සමිති ආඥා පනතේ 15 (4) වගන්තිය යටතේ සිදු කළ බවද දක්වා ඇත.

නමුත් පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛන සළකා බැලීමේදී පෙනී යන්නේ, වෘත්තීය සමිතිය ඉදිරිපත් කරන ලද කරුණු සළකා බලා වෘත්තීය සමිතිය තවදුරටත් බලාත්මක බව වෘත්තීය සමිති රෙජිස්ටාර් විසින් දක්වා ඇති අතර, එය 2010 වසරේ මුල් ලියාපදිංචිය තිබූ අවස්ථාවේ සිට පැවති අඛණ්ඩව

පවත්වාගෙන යන වෘත්තීය සමිතියක් බවට තීරණය කර ඇති බවය. එසේ තිබියදී දෙපාර්තමේන්තුව විසින් පෙත්සම්කරුගේ තනතුරු නාමයට එරෙහිව කටයුතු කර ඇත්තේ, ඔහු වෘත්තිය සමිතියක ලේකම්වරයෙකු ලෙස සිටියදී ගන්නා ලද තීරණයක් අනුව බව පෙනී යයි. එමෙන්ම 1999 අංක 56 දරණ කාර්මික ආරවුල් සංශෝධන පනතේ 32:11 යටතේ වූ (ඊ) වගන්තිය යටතේ, "වෘත්තීය සමිති සාමාජිකයින්ට සහන ලබාගැනීමට හෝ ඔවුන්ගේ වැඩ කිරීමේ තත්ත්වයන් යහපත් කිරීමේ තත්ත්වයන් යහපත් කරගැනීමට එකී කම්කරුවා හෝ නිලධාරියා විසින් ඒ වෘත්තීය සමිතියේ සේවා නියුක්තියේ නියමයන්ට හෝ කොන්දේසි වලට අදාළව සේවා යෝජකයාගේ ක්‍රියා හෝ නොකර හැරීම පිළිබඳව කරන ලද යම් ප්‍රකාශයක් සම්බන්ධව ඒ කම්කරුවා හෝ සාමාජිකයා සේවයෙන් පහ කිරිම හෝ ඔහුට විරුද්ධව අත්‍යාකාරයකින් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීම නොකළ යුතුය" යන්න දැක්වේ. මෙහිදී පෙත්සම්කරුට ගන්නා ලද වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය සම්බන්ධව ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ හැකිද යන්න ගැටළු සහගත වේ. විශේෂයෙන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLViii වැනි පරිච්ඡේදයේ 31 වැනි වගන්තියට යටත්ව පෙත්සම්කරුට එරෙහිව වෘත්තිය සමිති ලේකම්වරයෙකු ලෙස ගත් ක්‍රියාමාර්ගයක් පිළබඳව පියවර ගත නොහැකි බව නිරීක්ෂණ වේ.

එමෙන්ම වෘත්තීය සමිති රෙජිස්ටාර් කාර්යාලය විසින් හා කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ නීතිරීති දෙස අවධානය යොමු කිරිමේදී පෙනි යන්නේ, යම්කිසි වෘත්තීය සමිතියක ලේකම්වරයෙකු සම්බන්ධව යම් ක්‍රියාමාර්ගයක් ආයතනය විසින් ගැනීමට පෙර අදාළ දෙපාර්තමේන්තුවට අයත් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතින් ලිඛිත අවසරයක් ලබාගත යුතු බවය. එහෙත් එවැනි ලිඛිත අවසරයක් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතින් ලබාගැනීමකින් තොරව වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බවත් නිරීක්ෂණය වේ. ඒ අනුව නිගමනය කළයුතු වන්නේ පෙත්සම්කරු සම්බන්ධව වගඋත්තරකරුවන් කටයුතු කර ඇති ආකාරය ආයතන සංග්‍රහයට ද වෘත්තීය සමිති රෙජිස්ටාර් කාර්යාලයේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ නීතිරීති රෙගුලාසි සම්බන්ධව දක්වන චක්‍රලේඛ වලටද වෘත්තිය සමිති ආඥා පනතටද පටහැනි බවය.

**නිගමනය :-**

පෙත්සම්කරු පෙත්සම ගොනු කරන අවස්ථාව වන විට අනිවාර්ය නිවාඩු ගන්වා තිබි ඇති අතර, පෙත්සම විභාගයට ගන්නා අවස්ථාව වන විට සේවයේ පිහිටුවා ඇත. පෙත්සම්කරුට එරෙහිව මූලික පරීක්ෂණ සිදු කර ඇත්තේ, ආයතන සංග්‍රහයට පටහැනිව හා වෘත්තීය සමිති පිළිබඳ අඥා පනත උල්ලංඝනය කරමින් බවට අනාවරණය වී ඇත. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් පෙත්සම්කරුට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ගය මඟින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, පෙත්සම්කරුට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ග අවලංගු කර ඔහුට හිමිවිය යුතු උසස්වීම් ද අහිමි කරන ලද වෘත්තියට අදාළ වෙනත් දීමනා හෝ වරප්‍රසාද ද ලබාදීමට පියවර ගතයුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 01. 23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

[illegible]
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- අමාත්‍යතුමා,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

B/